# SCATS Malini Jayasinghe Short Drama Festival
## SCATS කෙටි නාට්‍ය උළෙල 2014



**අරමුණු**

1. මෙල්බන්හි ශ්‍රී ලාන්කික ප්‍රජාව අතර නාට්‍ය කලාව කෙරෙහි ඇල්මක් ඇති කිරීම
2. නාට්‍ය රසිකයිනගේ රසඥතාවය වැඩි දියුණු කිරීමට ඉඩ සලසාලීම
3, නාට්‍යකරණයේ විවිධ ශිල්පයීය දක්ෂතා ප්‍රගුණ කිරීමට අවස්ථාවක් සලසාදීම

**ඇතුලුවීමේ කොන්දේසි**

1. නාට්‍යය විනාඩි 20 ක් නොඉක්මවිය යුතුය
2. ස්වතන්ත්‍ර නිර්මාණ වඩා යෝග්‍ය වුවද පරිවර්තනයක් හෝ අනුවර්තනයක් වුවද ඉදිරිපත් කළහැකිය.
3. තමාට කැමති රංග තාක්ෂණයක් යොදාගත හැකි වේ.
4. නාට්‍යය සිංහල හෝ ඉංග්‍රිසි බසින් විය හැකිය.
5. ප්‍රමිති රැකගැනීම් සඳහා සංවිධායක මඩුල්ල වෙත නාට්‍ය පිටපතක් හා නිෂ්පාදනයේ පෙරදැක්මක් ලබාදිය යුතුය.
6. නාට්‍ය පිටපත පෙබරවාරි මස 28 වනදාට පෙර පහත සඳහන් ලිපිනයිනට හෝ Email වෙත එවිය යුතුය. SCATS Malini Jayasinghe Drama Festival, SCATS Seniors Western Region Errington Community Centre , Princess St. St Albans, හෝ SCATS GPO Box: 4229 Vic -3001
7. නාට්‍ය උළෙල අගෝස්තු මස අග පමන පැවැත් වීමට බලාපොරොත්තු වේ.
8. නාට්‍ය උළෙල සංවිධානය ගැන සියලු වගකීම් හා තීරණ SCATS සංවිධාණය සතුය.

**Contacts for further details AND refer to www.scats.org.au for the details in English**

Palitha Thilakaratne
palitha.t@gmail.com 0401 828 411

Upa Upadasa
upa@optusnet.com.au 0412 357 683

SCATS Short Drama Festival in 2014
is proudly sponsored by
Brimbank City Council, Victoria

Brimbank City Council

**Organized by SCATS Western Region Seniors**


## සන්නස Cartoon by PK




3 වන පිටෙන්

ජපක්ෂගේ "හේලෝ එක", නැතිනම් "ප්‍රභාවට" ගහන්නට තබා ළං වෙන්නවත් එකෙක් අහල ගං හතක හෝ නැත. ජෙප්පන් ද අවශේෂ වම්මුන් ද පරසක්වළ ගසමින් සිය මහා දේශපාලන මොඩලයන් ගැන කතා කළාට අපේ මිනිස්සු තාමත් චන්දෙ දෙන්නේ ඔවුන්ගේ සිතේ ඇඳි රාජලීලාව දෙස බලා මිස ඊනියා පොලිටිකල් වීව් එක බලා නොවේ.

රාජපක්ෂ යනු කූට මෙන්ම දක්ෂ පාලකයෙකි. එසේම ඔහු මෙරට ජන විඥාණය හොඳින් හඳුනන්නෙකි. මොන සෙල්ලම දැම්මත් සුදෝසුදු ආරිය සිංහල ඇඳුමෙන් සැරසී ජනතාවට පෙනෙන්ට ඉඳීම ම චන්ද කීයක් වැටීමට හේතුවක් ද? රනිල් හෝ වෙනත් එවැනි විපාක්ෂික නායකයකු ජනතාව සමග මෙතරම් සුහදව මුසු වනවා ඔබ දැක තිබේද? ඇත්තටම මේ එකෙක්ට වත් ඒ දැනීම නැත. පාරක් පාරක් ගණනේ මහා වීසාලෙට කටවුට් ගැසීමේ සිට වෙසක් පෝයට දෙන දන්සල දක්වා සියල්ල මෙකී ජන විඥාණයේ සංවේදී ස්ථාන ස්පර්ශ කරන "මරු නිල" වෙති. පත්තරේ හෝ බුකියේ හෝ බ්ලොගේ හෝ මොන තරම් ඔහු විවේචනය කරන්නකු වුවද, වරක් ඔහු මුණගැසී තේ කෝප්පයක් පානය කර කතා කළ පසු ඔහුගේ ප්‍රතිරූපයට වශීකෘත වන්නේ ඔහුගේ ඒ උපාය දැක්ම නිසා ය. අප වනාහි කන්න දුන්න මිනිහට බණින රටක් නොවන බව දැනගැනීමට පැරීසියේ සෝබෝන් විශ්ව විද්‍යාලයෙන් දේශපාලන උපාධියක් ලද යුතු නොවේ.

රාජපක්ෂ ආණ්ඩුව මේ ඡන්දය නොපරදින ඊළඟ හේතුව විමසා බැලීමට නම් අපි අනිත් පැත්තට මාරු වී බැලිය යුතුය. ඇත්තටම විකල්ප කියා ඇත්තේ මොනවාද? රනිල් වික්‍රමසිංහ යනු කිසිදා මේ පොළොවේ සුවඳ හඳුනානොගත් උගත් ගන්ධබ්බයෙකි. කොලෝනියල් යුගයේ නෂ්ටාවශේෂ සිහිගන්වන ගාලු කොටුව නැත්නම් ගෝල්ෆෙස් කාලතුවක්කුව සහ රනිල් අතර සංකේතාත්මක වෙනසක් ඇත්තටම තිබේද? ප්‍රයෝගිකව බැලූවොත්, එජාපය රාජ්‍ය සේවය පිණිස නඩත්තු කරනවා ඇරෙන්නට ඔහුගෙන් වුණු ලොකුම සාධනීය මෙහෙය වන්නේ, රාජපක්ෂ වෙනුවට රනිල් ආවොත් මොනවා වේවිද යන බිය ජනතාවට දැන්වීම ය. අනුර බණ්ඩාරනායක දේශපාලන ෆොසිලයක් වී නතර වුණේ යම් සේ ද, රනිල් ද දිනෙක මෙලක දේශපාලන ඉතිහාසයේ අමරණීය ලෙස ගෞරවාන්විත දේශපාලන ෆොසිලයක් ව නවතිනු ඇත. එතනින් එහාට වර්තමානයේ ඔහුගෙන් සාර්ථක දේශපාලන මෙහෙයුමක් අපේක්ෂා කරන්නේ නම්, ඒ එක්කම ඉබ්බන්ගෙන් උගුල්ලා ගන්නා ලද පිහාටු කීපයක් ද ඔහුගේ හිසේ ගැසිය හැකිවනු ඇත.

කාලතරණ යන්ත්‍රයක් සාදාගෙන අතීතයට ගොස් සිය වැරදි හදාගන්ට හැකිනම් ජෙප්පන් තරම් බලවත් සහ ආදර්ශවත් විකල්පයක් තවත් නැතිවනු ඇත. එහෙත් අවාසනාවකට, ඔවුන්ගේ වර්තමානය මොනතරම් තාර්කික දේශපාලනයක් වුවත් ඔවුන්ගේ අතීත අසාර්ථක අරගල නිසා ගලාගිය ලේ ගංගා තාමත් අපේ ජන විඥාණයේ ගලාබසී.. ඔවුන් මහා උජාරුවෙන් සමරන ඉල්මහ විරු සමරුවට ශාප කරන මිනිස්සු අද ද සුළුපටු නොවෙති. මාක්ස්වාදය නම් වූ කිසිදා මෙහි පැළ නොවන ඕක් ගසක් බදාගෙන නොසිට, මාක්ස්ගෙන් එහා විකල්ප සමාජවාදයක් ගැන සිතන්නට හෝ ඔවුන් සූදානම් නම්, මේ කතාව ලියන්නට අවශ්‍ය වෙන්නේ ද නැත. අවාසනාවකට එහෙම නැත. එහෙම වෙන පාටක් ද පෙනෙන තෙක් මානයක හෝ නැත. ඒ නිසාම, දිනන පක්ෂයකට ගසන මුක්කුවක් නැතිනම්, බලවත් පක්ෂයක් මට්ටු කරන හෙණ්ඩුවක් වනු ඇරෙන්නට මහ පුටුව නම් ජෙප්පන්ට ලැබෙන්නේ ද නැත.

සරත් ෆොන්සේකා යනු මිනිසෙක් මිස පක්ෂයක් නොවේ. මිනිස්සු ඡන්දය දෙන්නේ පක්ෂයක් ඇති මිනිහෙකුට මිස තනි මිනිහෙකුට නොවේ. ඔහුගේ කේන්තියට කටවරද්දා ගැනීම ඇරුණාම ඇත්තටම ඔහු නොදිනන හේතුව වන්නේ එතුමා තනි මිනිහෙක් බවත්, "යුද හමුදාපති ජෙනරාල් සරත් ෆොන්සේකා" කී විට ස්පර්ශ වන ස්නායු අන්තයන්, "ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ සරත් ෆොන්සේකා" කී විට ස්පර්ශ වන්නේ නැතිකමයි.

ඉතිං මේ තත්වය යටතේ ඕනෑම නැට්ටුවෙක්, නාටිකාංගනාවක් කරළියට දමා අඩව්ව ඇල්ලීමේ හැකියාව රාජපක්ෂ රෙජීමයට තිබීම අහන්නත් දෙයක් ද? දැනට ඔවුන්ට ඇති එකම ප්‍රතිරෝධය එල්ල වනුයේ "කැපුවත් නිල" මට්ටමේ සාම්ප්‍රදායික, ඒ කාලෙ අතට ඡන්දේ දීපු කාලෙ ඉඳන්ම ශ්‍රී ලංකා කාර, ප්‍රාදේශීය බලවතුන්ගෙනි. මේ බලවතුන් ටික වෙනුවට රූකඩ ටිකක් ගෙනාපු දාට සමස්ත පද්ධතියම ජයග්‍රහණය කර අවසන් වේ. එය වෛර කළ යුතු, ඊර්ෂ්‍යා කළ යුතු දෙයක් නොව, මනාව තක්සේරු කළයුතු හැකියාවකි. විපක්ෂය කරන්නට අකැමතිම දේ වන්නේද, රාජප-ක්ෂලාගේ මෙන්න මේ ජන විඥානය හඳුනාගැනීමේ හැකියාව පිළිගැනීම යි

**දැන් මේක ලිව්වේ කවද කියලද හිතන්නේ? මේක ලිව්වේ 2012 අන්තිම. දැන් මට කියහල්ල මොනවා හරි වෙනස් වෙලාද, වෙනස් වෙන්ඩ ඕනෙද කියල..**

මුහුණුපොතෙන් උපුටාගත්තකි


**සියලුම ජෝතිශ්‍ය කටයුතු**

දෙස් විදෙස් කේන්දු සෑදීම, පලාපල ලියා දීම,
කරදර ගැටළු වලට පිළියම්, අපල වලට පිළියම් හා වාර්තා......
විවාහ සිහුම්, පොරොන්දම් ගැලපීම, දෝෂ විමසීම හා මගහරවා ගැනීමට උපදෙස්.....
මංගල, මල්වර, නිවාස, විභාග, අකුරු කරවීමේ ශුභ නැකත්.......
නමට අකුරු, නම් තැබීම....
දළ, සිරිපති, ක්‍රිෂ්ණමූර්ති හෝ ඕනෑම ක්‍රමයකට කර දෙන්නෙමු.

*ඊ මේල්, දුරකතන මගින් විශේෂ කඩිනම් සේවා......*

රහස්‍යභාවය සුරකිමු

**සුබෝධා ජෝතිශ්‍ය සේවය**

www.wix.com/eppingvic/subodhabeauty
0433536097 subodhaastro@yahoo.com.au